සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

45 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

**භරත නැටුම් I, II**
பரதநாட்டியம் I, II
Bharatha Dancing I, II

**2018.12.11 / 0830 - 1140**

| | | | |
|---|---|---|---|
| **පැය තුනයි** | **අමතර කියවීම් කාලය** | - | **මිනිත්තු 10 යි** |
| *மூன்று மணித்தியாலம்* | மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| *Three hours* | Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## භරත නැටුම් I

**සැලකිය යුතුයි :**

- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
- ※ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( X ) ලකුණ යොදන්න.**
- ※ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** භරතනාට්‍යවල ආරම්භක අඩව්ව වනුයේ,
(1) පරවල් අඩව්ව ය. (2) තට් අඩව්ව ය. (3) නාට් අඩව්ව ය. (4) පායිච්චල් අඩව්ව ය.

**2.** ආයුබෝවන් කීම සඳහා භාවිත වන හස්ත මුද්‍රාව කුමක් ද?
(1) ඩෝලම් (2) ස්වස්තිකම් (3) පුෂ්පපුඩම් (4) අන්ජලී

**3.** "තකදිමි තකතකිට" කුමන වර්ගයේ ජාති ද?
(1) තිස්‍රජාති (2) කන්ඩජාති (3) මිස්‍රජාති (4) සංකීර්ණජාති

**4.** ග්‍රහයන් පෙන්වීම සඳහා භාවිත වන හස්ත මුද්‍රාව
(1) දේව හස්තම් ය. (2) දසඅවතාර හස්තම් ය.
(3) භාන්ධව්‍ය හස්තම් ය. (4) නවග්‍රහ හස්තම් ය.

**5.** භරතනාට්‍ය සංදර්ශන ඉදිරිපත් කිරීමේ ක්‍රමය නිර්මාණය කළේ,
(1) භරතමුනි ය. (2) තංජාවූර් සහෝදරයන් ය.
(3) නන්දිකේෂ්වර් ය. (4) තන්ඩුමුනි ය.

**6.** මිස්‍රජාති තුරුවතාලම් පෙන්වන්නේ පහත කුමකින් ද?
(1) $|_3\ O\ |_3\ |_3$ (2) $|_7\ O\ |_7$ (3) $|_7\ O\ |_7\ |_7$ (4) $|_7\ |_7\ O\ O$

**7.** අත් දෙකෙන් ම අර්ධචන්ද්‍ර මුද්‍රාව අල්ලා වම් අත උඩ, දකුණු අත තැබීම මත නිර්මාණය වන හස්ත මුද්‍රාව
(1) චක්‍රම් ය. (2) සන්ගු (හක්ගෙඩිය) ය.
(3) ගරුඩ ය. (4) මත්ස්‍යම් ය.

**8.** ජාති පහ සහ තාල හත එකතු වීමෙන් නිර්මාණය වන තාල සංඛ්‍යාව,
(1) 35 කි. (2) 108 කි. (3) 135 කි. (4) 175 කි.

**9.** පාද බේදම්වල 'බ්‍රමරි' යනු,
(1) පෙරට පැනීම ය. (2) කරකැවීම ය.
(3) එකම තැන සිටගැනීම ය. (4) පෙරට ඇවිදීම ය.

[දෙවැනි පිටුව බලන්න.

**10.** තේවාරම්හි නර්තනය පිළිබඳ කරුණු ඉදිරිපත් කරනු ලබන කාලය,
(1) පල්ලව කාලයයි. (2) සංග කාලයයි.
(3) සංග මරුවිය කාලයයි. (4) චෝල කාලයයි.

**11.** "තාකතජම්තරිතා" යන අඩව්වේ සොට්කට්ටු,
(1) තෙයි දිදි තෙයිතා (2) දිදි තෙයි දිදි තෙයිතා
(3) තෙයි තෙයි දිදි තෙයිතා (4) තෙයි තෙයි තෙයි දිදි තෙයිතා

**12.** උඩුක්කු වාදනය ප්‍රධාන තාල වාදනය ලෙස භාවිත වන නර්තනය කුමක් ද?
(1) ග්‍රාමීය නර්තනය (2) සාම්ප්‍රදායික නර්තනය
(3) බටහිර නර්තනය (4) වේදිකා නාට්‍යය

**13.** 'සමුනා ගමනේ' යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?
(1) සමූහගමනය (2) හක්ගෙඩිය පිඹීම
(3) උදරය (4) ශරීර අංග ස්පර්ශ කිරීම

**14.** ගොයම් කැපීම යන කාර්යය විස්තරාත්මකව පෙන්වනු ලබන වෘත්තීය නර්තනය,
(1) ධීවර නැටුම් ය. (2) දළු නෙළීමේ නර්තනය ය.
(3) කුරති නර්තනය ය. (4) අරිවු වෙට්ටු නර්තනය ය.

**15.** පාදසලංවල හඬට ගැලපෙන පරිදි තම නැටුම් ශිල්පීය ක්‍රම පිළිබිඹු කරන නර්තනය කුමක් ද?
(1) මනිපුරි (2) ඔඩිසි (3) කථක් (4) කුච්චුපුඩි

**16.** සාහිත්‍යවල දෙවියන් වර්ණනා කර නටන නර්තන අංගය කුමක් ද?
(1) අලාරිප්පු (2) ජදීස්වරම් (3) පදම් (4) ශබ්දම්

**17.** අංග ස්පර්ශය තුළින් ඉස්මතු වන භාවම් කුමක් ද?
(1) විභාවම් (2) වියපිසාරි භාවම් (3) අනුභාවම් (4) ස්ථායි භාවම්

**18.** මාධවීගේ කලඑළි රංගනය පිළිබඳ කියැවෙන ග්‍රන්ථය කුමක් ද?
(1) නාට්ටිය ශාස්ත්‍රම් (2) සිලපදිගාරම්
(3) කුත්තනූල් (4) අභිනය තර්පණම්

**19.** සිරස කවාකාරව කරකවන සිරෝ බේදම් කුමක් ද?
(1) ආලෝලිතම් (2) ආලෝහිතම් (3) පරිවාහිතම් (4) තුතම්

**20.** "නාදමූල මත්තලම් තාලම්..." යන ශ්ලෝකය අඩංගු වන්නේ පහත කුමක් තුළ ද?
(1) පාත්තිරප්‍රාණන් (2) අපාත්තිර ලක්ෂණම්
(3) පාත්තිරපහිපිරාණන් (4) පාත්තිර ලක්ෂණම්

**21.** ශබ්දම් නිර්මාණය වී ඇති රාගය කුමක් ද?
(1) රාගමාලිගා (2) වසන්තා (3) නාට්ටෙයි (4) මධ්‍යමාවතී

**22.** පාන්දව්‍ය හස්තම්වල දැතින්ම කම්සාස්සියම් අල්ලා, තැල්ල බැඳීම අභිනයෙන් පෙන්වා පසුව ඉදිරියේ ශිඛර මුද්‍රාව ඇල්ලීම මගින් පෙන්වන්නේ,
(1) මාමා ය. (2) නැන්දම්මා ය. (3) බිරිඳ ය. (4) ස්වාමියා ය.

**23.** විවිධ වෙස්වලට ප්‍රමුඛත්වය දී ඉදිරිපත් කරනු ලබන සාම්ප්‍රදායික නර්තනය කුමක් ද?
(1) කථකලි (2) භරත නාට්‍යම් (3) කුච්චුපුඩි (4) මෝහිනී ආට්ටම්

**24.** භරත නාට්‍යවල අන්තර් කොටස් දැක්වෙන වරණය තෝරන්න.
(1) නිරුත්තම්, නිරුත්තියම්, නාට්ටියම් (2) භාවම්, රාගම්, තාලම්
(3) අංගම්, ප්‍රත්‍යාංගම්, උපාංගම් (4) සිරෝ, දිරුෂ්ඨි, ග්‍රීවා බේදම්

**25.** ජදීෂ්වරම්වල කෝර්වෙව ආරම්භ කිරීමට පෙර නටන අඩව් එකතුව,
(1) අරුදි ය. (2) ජදී ය. (3) තීර්මානම් ය. (4) කෝර්වෙව ය.

**26.** සංකීර්ණජාති ජම්ප තාලම්වල එකතුව කීය ද?
(1) 12 (2) 14 (3) 18 (4) 29

[තුන්වැනි පිටුව බලන්න.

0197

**27.** ත්‍රිබංග තත්ත්වය පෙන්වන සාම්ප්‍රදායික නර්තනය කුමක් ද?
(1) ඔඩිසි (2) මනිපුරි (3) උඩරට නර්තනය (4) මෝහිනී නර්තනය

**28.** අඩවු අභ්‍යාසයෙහි යෙදෙන කාල ප්‍රමාණය දැක්වෙන වරණය තෝරන්න.
(1) විලම්බ කාලය (2) ත්‍රි කාලය (3) මත්තිම කාලය (4) තුරිද කාලය

**29.** දෙවන මණ්ඩි අඩව්ව නිර්මාණය වී ඇති තාලය කුමක් ද?
(1) ආදි තාලය (2) ඒක තාලය (3) අඩ තාලය (4) රූපක තාලය

**30.** කෝර්වෙ එකක අවසානයේ දී යෙදිය යුතු අඩව්ව කුමක් ද?
(1) සරුක්කල් අඩව්ව (2) මගුඩ අඩව්ව
(3) පරවල් අඩව්ව (4) කුදිත්තු මෙට්ටඩවුව

**31.** තාලයට ගායනා නොකර සාහිත්‍ය රාගයක් ලෙස දිගට ගායනා කිරීම,
(1) අෂ්ඨපදි ය. (2) විරුත්තම් ය. (3) කීර්තනෙ ය. (4) තිල්ලානා ය.

**32.** 'තදින්ගිණතොම්' වල ජාතිය කුමක් ද?
(1) තිස්රජාති (2) චතුස්‍රජාති (3) කණ්ඩජාති (4) මිශ්‍රජාති

**33.** ප්‍රථම වරට දේවදාසී 400 කෝවිලේ නර්තනය සඳහා පත් කළේ කුමන වකවානුවේ ද?
(1) සංග කාලම් (2) සංග මරුවිය කාලම් (3) චෝලර් කාලම් (4) පල්ලව් කාලම්

**34.** ප්‍රේක්ෂකයන් මුල් කර ගත් නාට්ටු කුත්තුවේ පිළිගැනීමේ නැටුම,
(1) වඩමෝඩි ය. (2) තෙන්මෝඩි ය. (3) වාසාප්පු ය. (4) තෙන්පාංගු ය.

**35.** පංච පාතංගල් (ඊතල 5) ඊතල එවන ලද්දේ,
(1) ඉන්දිරන් විසිනි. (2) මන්මදන් විසිනි. (3) ක්‍රිෂ්ණන් විසිනි. (4) මුරුගන් විසිනි.

● අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

**36.** 'දෙයිවීග ආඩ්ඩකලෙ' යන ග්‍රන්ථය ලියන ලද්දේ ...................... විසිනි.
(1) භරත මුනිවර (2) නන්දිකේෂ්වර්
(3) මීනාක්ෂි සුන්දරම්පිල්ලෙ (4) වලුවූර් රාමයියා පිල්ලෙ

**37.** භීබත්ස්‍ය රසයට අදාළ වර්ණය ......................... වේ.
(1) සුදු (2) කොළ (3) නිල් (4) කළු

**38.** නර්තනයට නිපුණවූවන් සංග කාලය තුළ ......................... .ලෙස හඳුන්වනු ලැබිණි.
(1) කුත්තර් (2) වෛනීකර් (3) පානර් (4) පාඩිනියර්

**39.** තිරුකුට්ප්‍රාලම් ප්‍රදේශයේ සිත්තිර සභා මණ්ඩපයෙහි පැවැත් වූ තාණ්ඩව ..................... වේ.
(1) මරෛත්තල් (2) අරුලල් (3) කාත්තල් (4) පඩෛත්තල්

**40.** ආන්ද්‍ර ප්‍රදේශයෙන් බිහිවූ නර්තනය .............................. වේ.
(1) භරතනාට්‍යම් (2) මනිපුරි (3) ඔඩිසි (4) කුච්චුපුඩි

❊ ❊

[හතරවැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**45 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

හරත නැටුම් **I, II**
பரதநாட்டியம் **I, II**
Bharatha Dancing **I, II**

## හරත නැටුම් II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා අනෙකුත් ප්‍රශ්නවලින් **හතරක්** ද තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) තංජාවූර් කෝවිලෙහි නර්තන කටයුතු වර්ධනය කළ රජු කවුද?

(ii) 'කිටතකතරිකිටතොම්' අඩව්ව නිර්මාණය වී ඇති තාලය කුමක් ද?

(iii) කුත්තු කලාවේ පුහුණුකරුවන් හැඳින්වෙන්නේ කෙසේ ද?

(iv) අද්භූත රසයට උදාහරණයක් වන දෙවියා කවුද?

(v) තත්තත්කාර හඬ සමග ඉදිරිපත් කෙරෙන නර්තන අංගය කුමක් ද?

(vi) ඇඳුම් පැළඳුම් මගින් අදහස් ප්‍රකාශ කරන අභිනය කුමක් ද?

(vii) අත්වලින් ශබ්ද නගා නටන ගැමි නර්තනය කුමක් ද?

(viii) සම්යුද හස්තම්වල 'ලීලා කන්තුකදාරනේ' කුමන හස්ත විනියෝගයෙහි ඇතුළත් ද?

(ix) මාධවීගේ නර්තනයෙහි හස්ත අභිනය වර්ග **දෙක** සඳහන් කරන්න.

(x) විභාවයෙහි වර්ග **දෙක** මොනවා ද?

**2.** (i) ඔබ ඉගෙන ගත් ජදීශ්වරම් අංගයෙහි රාගම්, තාලම් ලියන්න.

(ii) ජදීශ්වරම් හි ලක්ෂණ ලියන්න.

(iii) ඔබ ඉගෙන ගත් ජදීශ්වරම්වල තුන්වැනි කෝර්වෙව සංගීත සංකේත මගින් ලියන්න.

**3.** සංග කාල නර්තන කලාව පිළිබඳ ව විස්තර කරන්න.

**4.** පහත සඳහන් හස්තම්වලට අදාළ විනියෝග ජ්වායේ ශ්ලෝක හා අර්ථ සමග ලියන්න.

(i) කබිත්තම් (ii) පද්ම කෝසම් (iii) කර්කඩහම් (iv) කීලංගම්

**5.** කලානිදි පොන්නයියා පිල්ලෙගේ ජීවිත කතාව ලියන්න.

**6.** පහත සඳහන් ඒවා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) දර්මිහල් (ii) පුෂ්පාංජලී (iii) සභානායකයන්

**7.** (i) සාම්ප්‍රදායික භරත නාට්‍ය සංදර්ශනවල භාවිත කෙරෙන සංගීත භාණ්ඩ **හතරක්** නම් කරන්න.

(ii) සංගීත භාණ්ඩ භරත නාට්‍ය සංදර්ශනවල දී කෙසේ දායක වේ ද යන්න විස්තර කරන්න.

※ ※ ※

PAST PAPERS WIKI